ගැටුම් වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතිය- "බී" සංරචකය

---------------------------------------------------------------------------------------

1. මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ ;

(අ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක තැන්පතුව, සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට කරන ලද ඌනපූරණයන් ව්‍යාපෘතිය මගින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව ,

(ඉ) පූර්ව වර්ෂයේ මාගේ විගණන වාර්තාව මගින් පෙන්නුම් කරන ලද අඩුපාඩු නිවැරදි කිරීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව සහ;

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 මූල්‍ය කාර්යසාධනය

---------------------

(අ) මූල්‍ය ප්‍රකාශන සහ විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.252,461,586 ක් වූ අතර 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.253,364,874 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් මාස හතරක කාල

පරිච්ඡේදය සඳහා වූ වියදම් සහ 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2010 සැප්තැම්බර් 02 සිට දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා වියදම | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ - ජල මණ්ඩලය | 76,651,454 | - | 76,651,454 |
| - ලංවිම | 139,171,453 | - | 139,171,453 |
| උපදේශක සේවා - ජල මණ්ඩලය | 5,038,962 | - | 5,038,962 |
| වර්ධක මෙහෙයුම් පිරිවැය - | | | |
| - ජල මණ්ඩලය | 4,198,351 | 216,086 | 4,414,437 |
| - PCQAU * | 12,520,504 | 687,202 | 13,207,706 |
| - උපකරණ - PCQAU | 1,947,387 | - | 1,947,387 |
| මූල්‍ය ගාස්තු | | | |
| - බැඳීම් ගාස්තු | 12,001,715 | - | 12,001,715 |
| - පොළී | 931,760 | - | 931,760 |
| එකතුව | 252,461,586 | 903,288 | 253,364,874 |

* PCQAU = ව්‍යාපෘති සම්බන්ධීකරණ සහ තත්ත්ව සහතික කිරීමේ ඒකකය

(ආ) සංරචකය සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදනය රු.1,224,240,000 ක් වූ අතර වාර්ෂික වියදම රු.252,461,586 ක් විය. එම වියදමෙන් රු.12,933,475 ක් බැඳීම් ගාස්තු සහ පොළී වියදම විය. ඒ අනුව සංරචකය විසින් සෘජුවම සංරචකයේ ක්‍රියාකාරකම් සඳහා වැය කර තිබුණේ සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ප්‍රතිපාදනයෙන් රු.239,528,111 ක් හෙවත් 19.5% ක් පමණි.

## 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පලමු ජනනීය අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 577,254 | 64,048,067 |
| <u>එකතු කළා</u> : ඌනපූර්ණය කිරීම් | 235,982 | 26,878,350 |
| විදේශ විනිමය වාසිය | - | 986,892 |
| | 813,236 | 91,913,309 |
| <u>අඩු කළා:</u> ආපසු ගැනීම් - PCQAU | 99,510 | 10,990,393 |
| - ජල මණ්ඩලය | | |

| | | |
|---|---|---|
| | 194,172 | 21,714,252 |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 519,554 | 59,208,664 |

3. විගණන නිරීක්ෂණ

3.1 ව්‍යාපෘති පරිපාලන අත්පොත (PAM) සමග අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) අත්පොතෙහි 15 පරිච්ඡේදයේ විධිවිධාන අනුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මුලසුන දරන ජාතික නියාමන කමිටුව (NSC) මාසිකව රැස්විය යුතුය. කෙසේ වෙතත් වර්ෂය තුලදී පවත්වා තිබුණේ (NSC) රැස්වීම් වාර එකක් පමණි. එමනිසා ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි උපදෙස් අනුව, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයන්ට ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් ප්‍රමාණවත් මග පෙන්වීමක් කිරීමට සහ සංරචකයේ සමස්ථ ප්‍රගතිය සමාලෝචනය කිරීමට කමිටුවට නොහැකි වී තිබුණි.

(ආ) ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි 115 පරිච්ඡේදය අනුව මෙම ව්‍යාපෘතිය සඳහා ලංසු තැබීමේ ක්‍රියාපටිපාටිය, ලංසුකරුවන් සහ කොන්ත්‍රාත් පිරිනැමීම, ව්‍යාපෘතිය යටතේ ප්‍රදානය කරන ලද අරමුදල් යොදවන ආකාරය සහ භෞතික ප්‍රගතිය ඇතුලත්ව පිළියෙල කරන ලද වෙබ් අඩවියක් අමාත්‍යාංශයට තිබිය යුතුය. නමුත් 2012 අප්‍රියෙල් 30 වන විටත් එවැනි වෙන් කරන ලද වෙබ් අඩවියක් නිර්මාණය කොට නොතිබුණි. "ප්‍රසම්පාදන දැන්වීම් සහ අදාල තොරතුරු ආසියානු සංවර්ධන බැංකු වෙබ් අඩවියේ පල කරන ලද අතර අමාත්‍යාංශ වෙබ් අඩවියට සමගාමීව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා කටයුතු කරමින් සිටින බව" ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වරයා විසින් කරුණු දක්වා තිබුණි.

3.2 අරමුදල් උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත දැක්වෙන ප්‍රභේදයන් යටතේ ව්‍යාපෘතියේ "බී" සංරචකයේ කාර්යයන් ඉටු කිරීම සඳහා රු.මිලියන 4,710.9 ක් (ආසන්න වශයෙන්) මූල්‍ය ප්‍රතිපාදනය කර තිබුණු අතර 2011 දෙසැම්බර් 31 දිනට දරන ලද තථ්‍ය වියදම පහත දැක්වෙන පරිදි සපයන ලද අරමුදලෙන් රු.මිලියන 253.36 ක් හෙවත් 5.38% ක් විය.

| විස්තරය | ඇස්තමේන්තුගත වියදම | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම | වියදම මුළු ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | % |
| ආයෝජන පිරිවැය | | | |
| සිවිල් වැඩ | 3,417.00 | 215.82 | 6.32 |
| උපකරණ සහ ලී බඩු | 191.35 | 1.95 | 1.02 |
| උපදේශක නිර්මාණ සහ අධීක්ෂණය | 34.17 | 5.04 | 14.75 |
| පුනරාවර්තන පිරිවැය | | | |
| වර්ධක | 103.65 | 4.41 | 4.26 |
| ව්‍යාපෘති කළමනාකරණය - PCQAU | 127.57 | 13.21 | 10.35 |
| භෞතික අසම්භාව්‍යයන් | 386.12 | - | - |
| මිල අසම්භාව්‍යයන් | 339.42 | - | - |
| උප එකතුව | 4,599.28 | 240.43 | 5.23 |
| මූල්‍ය ගාස්තු (බැඳීම් ගාස්තු සහ පොළී) | 111.62 | 12.93 | 11.59 |
| එකතුව | 4,710.90 | 253.36 | 5.38 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ කටයුතු 2013 ජූනි 30 වන විට නිම කිරීමට අපේක්ෂිතය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට "බී" සංරචකය විසින් උපයෝජනය කර තිබුණේ අනුමත ප්‍රතිපාදනයෙන් 5.38% ක් පමණි. නියමිත කාල පරිච්ඡේදය තුළදී ව්‍යාපෘති සංරචකයෙ කටයුතු නිම කිරීම සම්බන්ධයෙන් අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

(ii) සිවිල් වැඩ සඳහා රු. මිලියන 3,417 ක් වෙන් කර තිබුණු නමුත් අරමුණුගත කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණේ සමස්ථ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 215.82 ක් හෙවත් 6.32% ක් පමණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් සමස්ථ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව 2011 වර්ෂය අවසාන වන විට සිවිල් වැඩ යටතේ බලය සහ ජල සැපයුම් ක්‍රියාකාරකම් වලින් අඩකට වැඩියෙන් සම්පූර්ණ කර තිබිය යුතුය.

(iii) ණය ගිවිසුමේ 3.02 වගන්තියට අනුව ණය ගන්නා විසින් වැය නොකරන ලද ණය මුදල මත 0.15% ක්වූ බැඳීම් ගාස්තු සහ ඒ සඳහා පොළියක් ගෙවිය යුතුය. ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, ව්‍යාපෘතිය කටයුතු කර තිබුණේ නම් බැඳීම් ගාස්තුව ගෙවන ලද මුදලට වඩා අඩු කර ගැනීමට හැකියාව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ "බී" සංරචකයේ ඌන කාර්යසාධනය හේතුවෙන් ආසියානු සංවර්ධන

බැංකුව විසින් බැඳීම් ගාස්තු සහ ඒ සඳහා පොළී වශයෙන් පිළිවෙලින් රු.12,001,715 ක් සහ රු.931,760 ක් ව්‍යාපෘතිය වෙනුවෙන් ණය ගිණුමෙන් ආපසු අය කරගෙන තිබුණි.

3.3 බඳවා ගැනීම්

---------------

2007 අප්‍රියෙල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.2.9 වගන්තියේ දක්වා ඇති අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, සේවා පලපුරුද්ද සහ දක්ෂතාවයන් අනුව ව්‍යාපෘතියේ පරිසර විශේෂඥ (මට්ටම සී) තනතුර සඳහා රජයේ දීප ව්‍යාප්ත සේවයේ පලමු පන්තියේ හෝ සමාන තත්ත්වයේ නිලධාරියෙකු පත් කළ යුතුය. කෙසේ වතත්, ව්‍යාපෘතිය විසින් එම සුදුසුකම් සපුරා නොමැති පරිසර විශේෂඥවරයෙක් බඳවා ගෙන සමාලෝචිත වර්ෂය තුලදී එම නිලධාරියාට මාසික දීමනා වශයෙන් රු.365,500 ක් ගෙවා තිබුණි.

5.4 ප්‍රතිපූර්ණය කිරීම්

--------------------

අංක බී0004 දරන රු.1,129,380 (එක්සත් ජනපද ඩොලර් 9,915.54) ක් වූ ප්‍රතිපූර්ණ ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන හේතුන් නිසා බැංකුව විසින් රඳවාගෙන තිබුණි.

(i) කොන්ත්‍රාත්කරුගේ නම වියදම් ප්‍රකාශයේ (SOE) ඇතුලත් නොවීම

(ii) ප්‍රසම්පාදන බැඳීම් සාරාංශ පත්‍රිකාව, (PCSS) ආපසු ගැනීම් ඉල්ලුම් පත් සමග අමුණා නොතිබීම